# නායයෑම් ආපදා අවමකරණය තුළින් නායයෑම්වලට ගොදුරු වීමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

## ආපදා අවදානම් ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම

ආපදා අවදානම් ස්ථානීය අංක 96

වල්පොල - ස්ථානය 02

මාතලේ දිස්ත්‍රික්කය

2020 මාර්තු

(


ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 05
දු:ක: 011 2588946/011 2503826/ 011 2503431

# පටුන

*1. හැඳින්වීම* *6*

1.1 ව්‍යාපෘති සාරාංශය 6

1.2 අපේක්ෂිත පරිශීලකයින් 6

*2. ව්‍යාපෘතියේ සහ ස්ථානයේ විස්තරය* *7*

2.1. යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයේ නම 7

2.2. ස්ථානයේ විස්තරය 7

*3. නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු* *9*

3.1 පෙර වාර්තා වන ලද සිදුවීම් 9

3.2. නායයෑමේ බලපෑම් සහ ප්‍රතිවිපාක 10

3.3. නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග 11

3.4. පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම 11

3.5. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය (ප්‍රගතිය) 11

*4. බෑවුම් අස්ථායී වීම සිදුව ඇති ප්‍රදේශය හා ආසන්න ප්‍රදේශය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් මට්ටම* *13*

4.1. බෑවුම් අස්ථායී ප්‍රදේශය ආශ්‍රිත පරිසරය 13

4.2. වර්තමාන අවදානම් මට්ටම 13

*5. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අවදානම් අවමකරණ ක්‍රම* *13*

*6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන්* *13*

7. සිදුවිය හැකි සමාජයීය හා පාරිසරික බලපෑම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම 15

7.1. ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම 15

7.2. අහිතකර බලපෑම 15

7.2.1 ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම 15

7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාවේ බලපෑම් 15

7.2.1.2 ජල දූෂණ බලපෑම් 15

7.2.1.3 ඛාදන බලපෑම් 15

7.2.1.4 විවෘත මලපහ කිරීම් සහ ජලය ආශ්‍රයෙන් පැතිරිය හැකි රෝග තත්ත්වයන් 15

7.2.1.5 පහළ බෑවුමේ ජල මූලාශ්‍ර භාවිත කරන්නන්ට සිදුවිය හැකි බලපෑම 16

7.2.1.6 භූගත ජල මට්ටමට සහ ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම 16

7.2.1.7 ජලය හෝ තෙත් බිම් මත ඇති වන බලපෑම් 16

7.2.2 පාරිසරික බලපෑම 16

7.2.2.1 ශබ්ද දූෂණය, කම්පනය, පිපිරවීම, ඉදිකිරීම් අතරතුර ඇති වන බලපෑම්, ගොඩනැගිලිවලට විය හැකි හානිය හා යටිතල පහසුකම් 16

7.2.2.2 වායු දූෂණ බලපෑම 16

7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලු 16

7.2.2.4 පිපුරුම් සහ අන්තරායකර ද්‍රව්‍ය 16

7.2.3 පරිසර විද්‍යාත්මක බලපෑම 16

7.2.3.1 වැදගත් වනජීවී වාසස්ථානයන්ට සිදුවන බලපෑම 17

7.2.3.2 ශාක ව්‍යාප්තියට සිදුවන බලපෑම 17

7.2.4 සමාජ ආර්ථික බලපෑම 17

7.2.4.1 ආපදා අවදානම අවම කිරීමේ ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තයට සිදුවන බලපෑම් 17
7.2.4.2 කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිලි වල ඇතිවන ඉරිතැලීම් 17
7.2.4.3 සේවා සැපයීම කෙරෙහි වන බලපෑම් (ජල සැපයුම, අපජලය, විදුලිය) 17
7.2.4.4 යටිතල පහසුකම් සහ ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් වන බලපෑම් 17
7.2.4.5 ඉදිකිරීම් අතරතුර පිටස්තර පුද්ගලයින් පිවිසීමේ අවදානම 17
7.2.4.6 කඳවුරු භූමිය සහ අනෙකුත් අවශ්‍යතා 18
7.2.4.7 වැඩබිම අවට ජීවත් වන පුද්ගලයින් හා කම්කරුවන් අතර සබඳතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව 18
7.2.4.8 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව 18
7.2.4.9 මාර්ග ගමනාගමනය සහ ඉදිකිරීම් කටයුතු වලින් මහජනතාවට ආරක්ෂාව සැපයීම 18
*8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම් 18*
8.1 මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් අවශ්‍යතාවන්ට අමතරව විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන් 18
8.2 ළමා හා බලහත්කාර ශ්‍රමය 18
*9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP) 19*
9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම 19
9.2 තාවකාලිකව ඉවත් කිරීම 19
9.3 හානියට පත් ඉදිකිරීම් ව්‍යුහයන් ඉවත් කිරීම (අබලි ද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව ඉඩම් හිමිකරුවන්ගේ නිර්දේශ ලබා ගැනීම) 19
9.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපළ හා භාවිතයන් අහිමි වීම වෙනුවෙන් වන්දි ගෙවීම 19
9.5 මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වේ 19
9.6 පිරිසැලසුම් පදනම් කරගත් පාරිසරික/සමාජයීය කළමනාකරණය 20
9.7 ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ සිදුවන බලපෑම් අවම කිරීම 21
*10. මහජනතාව සහ ව්‍යාපෘති පාර්ශවකරුවන් දැනුවත් කිරීම - පවත්වන ලද හෝ පැවැත්වීමට නියමිත මහජන දැනුවත් කිරීම් 28*
10.1. මහජනතාව දැනුවත් කිරීම 28
*11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 වෛරසය වැළැක්වීමේ පියවර 28*
*12. කම්කරු කළමනාකරණය 28*
*13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම 29*
13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම 29
13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ඉඩම් හිමියන්ගේ අනුමැතිය 29
13.3 ඉඩම් හිමිකාරිත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව / නීත්‍යානුකූල ගිවිසුම 29
*14. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය 30*
*15. ව්‍යාපෘති තොරතුරු නිකුත් කිරීම 31*
*ඇමුණුම 1: හඳුනාගත් ස්ථානයේ ස්වභාවය සහ උපදේශනය දැක්වෙන ඡායාරූප 32*

## රූප සටහන් ලැයිස්තුව


රූපය 1 - යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයට ප්‍රවේශ මාර්ගය ........ 8

රූපය 2 - යෝජිත ආපදා අවදානම්කරණ ස්ථානයේ චන්ද්‍රිකා ඡායාරූපය ........ 9

රූපය 3 - හරස්කඩ, ඉඩම් භාවිතය, අවදානම් ඒකක සහ ස්ථානයේ විශේෂ ලක්ෂණ ........ 10

රූපය 4 : අවම කිරීමේ ස්ථානයහි හරස්කඩ, ඉඩම් පරිහරණය සහ මූලික තොරතුරු ........ 12

රූපය 5 - : ව්‍යාපෘති කටයුතු හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචකයන් ........ 14


## වගු සටහන් ලැයිස්තුව


වගුව 1 - අහිතකර බලපෑම් සහ බලපෑම්වල තීව්‍රතාවය ........ 15

වගුව 2- පිරිසැලසුම් අදියරයේදී පාරිසරික සමාජයීය නිර්දේශ ........ 20

වගුව 3- ES & HS කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" ........ 22

වගුව 4- ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන් ........ 24

වගුව 5- ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය ........ 27

වගුව 6 - නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව එකඟතාව සහ අනුමැතිය ........ 29

වගුව 7- අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව ........ 30

වගුව 8- යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය ........ 31

# කෙටි යෙදුම්

| | |
|---|---|
| AIIB | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව |
| CEA | මධ්‍යම පරිසර අධිකාරිය |
| CEB | ලංකා විදුලි බල මණ්ඩලය |
| DFC | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| DS | ප්‍රාදේශීය ලේකම් |
| DWLC | වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| EH & S | පාරිසරික, සෞඛ්‍ය සහ සමාජයීය |
| E&SU of PMU | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික සහ සමාජයීය ඒකකය |
| ESMF | පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව |
| ESMP | පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම |
| GN | ග්‍රාම නිලධාරී |
| GOSL | ශ්‍රී ලංකා ආණ්ඩුව |
| GSMB | භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |
| LHS | වම් පස පෙදෙස |
| NBRO | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය |
| RDA | මාර්ග සංවර්ධන අධිකාරිය |
| SSE & SMP | ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම |

# 1. හැඳින්වීම

## 1.1 ව්‍යාපෘති සාරාංශය

මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ පළාත් 6කට අයත් දිස්ත්‍රික්ක 11ක ආපදා අධි අවදානම් කලාපවල පිහිටා ඇති අස්ථායී බෑවුම් සඳහා පිළියම් යෙදීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා ණය ආධාර සපයනු ලබන්නේ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසිනි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී AIIB හා ශ්‍රී ලංකා රජයේ නීතිරීති සහ පාරිසරික හා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුකූල වීම අත්‍යවශ්‍ය වේ. AIIB හි පාරිසරික හා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිමය අවශ්‍යතාව අනුව ව්‍යාපෘතියේ ස්වභාවය සහ එහි ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය සඳහා පාරිසරික සහ සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් (ESMF) නිර්මාණය කළ යුතුය.

මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවෙහි (ESMF) අරමුණ වන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී AIIB හි ආරක්ෂණ ක්‍රමවේද සහ ජාතික පාරිසරික ප්‍රඥප්ති හා සමාජයීය ප්‍රඥප්ති පිළිබඳ මාර්ගෝපදේශ සැපයීමය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) නම් කර ඇත. ව්‍යාපෘතියට සම්බන්ධ වන සියළුම පාර්ශවයන් පාරිසරික හා සමාජයීය කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව (ESMF) යටතේ සමස්ථ ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරන ලද පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කරනු ඇතැයි NBRO විසින් අපේක්ෂා කෙරේ. එමගින් ව්‍යාපෘති කාලසීමාව අතරතුර පරිසරයට හා සමාජයට වන බලපෑම අවම වනු ඇත.

පාරිසරික හා සමාජයීය සැකැස්ම සහ සෞඛ්‍ය හා ආරක්ෂණ තත්ත්වයන් ව්‍යාපෘති ස්ථානයෙන් ස්ථානයට වෙනස් වන බැවින් එවැනි වෙනස්වන විශේෂිත තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. එබැවින් පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුවට (ESMF) අනුව එක් එක් නායයෑම් ස්ථානයට අදාළව පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) සැකසිය යුතුය. මෙම ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජ කළමනාකරණය පිළිබඳ සැළසුම් මගින් ව්‍යාපෘති කටයුතු සැලසුම් කිරීම, පිරිසැලසුම් කිරීම (Design), ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම යන අදියරයන්හි දී පාරිසරික, සමාජයීය, සෞඛ්‍ය, සහ ආරක්ෂණ කළමනාකරණය සම්බන්ධයෙන් සලකා බැලිය යුතු අංශයන් පිළිබඳව අවශ්‍ය මාර්ගෝපදේශයන් සපයනු ඇත.

වල්පොල - ස්ථානය 02 හි පිහිටි නායයෑම් ආපදා අවදානම් අවමකරණ ස්ථානයට අදාළ පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම පහත දැක්වේ. ප්‍රදේශයේ පාරිසරික හා සමාජයීය සාධකයන් පිළිබඳව සිදු කළ පුළුල් අධ්‍යයනයකින් පසු මෙම සැලැස්ම සකස් කර ඇති අතර එමගින්:

i. ව්‍යාපෘතියේ බලපෑමට හසුවන ප්‍රදේශයේ පවත්නා සංවේදී පාරිසරික හා සමාජයීය ලාක්ෂණිකයන් හඳුනා ගැනීම

ii. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවිය හැකි සුවිශේෂී පාරිසරික හා සමාජයීය බලපෑම් හඳුනා ගැනීම

iii. යෝජිත අවදානම් අවමකරණ පියවරයන්

iv. මෙම ව්‍යාපෘතියට විශේෂිත යෝග්‍ය පාරිසරික හා සමාජයීය අවශ්‍යතාවන් හඳුනා ගැනීම

v. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලය තුළ අනුගමනය කළ යුතු විශේෂිත පාරිසරික හා සමාජයීය රෙගුලාසි සහ විධි විධාන පිළිබඳ අධ්‍යයනය කිරීම

## 1.2 අපේක්ෂිත පරිශීලකයින්

යෝජිත ව්‍යාපෘතිය සහ නායයෑම් ආපදා අවමකරණ පියවරයන් හේතුවෙන් ඇතිවිය හැකි ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය ගැටලු පිළිබඳ සවිස්තරාත්මක අවබෝධයක් මෙම

ලේඛනය තුළින් සපයනු ලබයි. ව්‍යාපෘතියේ ESMP සංරචක ක්‍රියාත්මක කිරීමේදී නායයෑම් ආපදා අවදානම්කරණ පිරිසැලසුම් සිදු කරනු ලබන කණ්ඩායම (Landslide mitigation design team), ව්‍යාපෘති කළමණාකරන ඒකකය (Project Management Unit) සහ කොන්ත්‍රාත්කරු විසින් එම තොරතුරු භාවිත කරනු ඇත. ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ තක්සේරු වාර්තා (SSE & SMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි වෙබ් අඩවියේ (NBRO Website) ප්‍රදර්ශනය කරන අතර මේ පිළිබඳව උනන්දුවක් දක්වනු ලබන ඕනෑම පාර්ශවයකට (මහජනතාවට හෝ පාර්ශවකාර සංවිධානවලට) ඒවා පරිශීලනය කිරීමට හැකියාව ලැබේ. එමගින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමව කොන්ත්‍රාත්කරු විසින් සකස් කරනු ලබන පාරිසරික හා සමාජයීය කළමනාකරණ ක්‍රියාකාරී සැලැස්මේ (SS- ESMAP) කොටසක් වන ස්ථානීය විශේෂිත පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලසුම්වලට අවශ්‍ය පදනම නිර්මාණය කරනු ඇත.

## 2. ව්‍යාපෘතියේ සහ ස්ථානයේ විස්තරය

### 2.1. යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයේ නම

යෝජිත අපදා අවමකරණ ස්ථානය, වල්පොල-ස්ථානීය අංක 2 ලෙස නම් වන අතර, එය මාතලේ දිස්ත්‍රික්කයේ පහල වල්පොල මාර්ගයේ පිහිටා ඇත.

### 2.2. ස්ථානයේ විස්තරය

යෝජිත නායයෑම් ආපදා අවදානම් අවමකරණ ස්ථානය මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාශයට (E334B) අයත් වේ.

**හඳුනාගත් ස්ථානයේ ඛණ්ඩාංක→** 7'559032°N සහ 80'575783°E

**උන්නතාංශය →**මෙම ස්ථානයේ උන්නතාංශය අඩි 1504 ( මීටර් 458 AMSL) පමණ වේ.

**ආසන්නතම නගරය→** මෙම ආපදා අවදානම්කරණ ස්ථානය ආසන්නතම පරිපාලන නගරය ලෙස හඳුන්වන යටවත්ත නගරයට කි.මී.2.2 ක් දුරින්ද , වාණිජමය නගරය වන මාතලේ දිස්ත්‍රික්කයට කි.මී. 17 දුරින්ද පිහිටා ඇත.

**ප්‍රවේශ මාර්ගය→** යටවත්ත නගරය හරහා යන දේවාලේවත්ත මාර්ගයේ කි.මී.2.2 පමණ ගමන් කිරීමේදී මෙම ස්ථානයට ප්‍රවේශ විය හැක. අදාළ ආපදා අවමකරණ ස්ථානයට ප්‍රවේශ විය හැකි මාර්ගය පහත 01 රූප සටහනේ දැක්වේ.




*රූපය 1 - යෝජිත ආපදා අවදානම් අවමකරණ ස්ථානයට ප්‍රවේශ මාර්ගය*

### 2.3 භූ විද්‍යාත්මක ස්වභාවය හා ඉඩම් හිමිකාරිත්වය

යෝජිත අපදා අවමකරණ ස්ථානය මාතලේ දිස්ත්‍රික්කයේ පහල වල්පොල මාර්ගයේ පිහිටා ඇත. මෙම ස්ථානයේ සාමාන්‍ය භූ විෂමතාවය බෑවුමේ ආරම්භයේ සිට බෑවුමේ අවසානය දක්වා අංශක 30ත් 45 අතර වෙනස් වන බෑවුම් වලින් සමන්විත වන අතර, හරස්කඩ දිග මීටර් 153ක් පමණ වේ. බෑවුමේ ප්‍රධාන කොටස අංශක 40-45 ක පමණ උච්චාවචනයක් පෙන්වන අතර, එහි ඉහළම කොටස ක්‍රමානුකූල බෑවුමකින්ද පහළ බෑවුම ප්‍රවේශ මාර්ග, ගොඩනැගිලි සහ කෘෂිකාර්මික ඉඩම් වලින්ද සමන්විත වේ. විවිධ ප්‍රමාණයේ පාශාණ කොටස් ඉහළ බෑවුම පුරා තැනින් තැන විසිරී පවතින බව නිරීක්ෂණය කළ හැකි අතර, වැසි ජලය පස මතුපිටින් ගලා යාමෙන් ඇති වූ හදිසි පාංශු චලනයන් නිසා එම පාංශු ස්ථරය බෑවුමේ පහළ කොටසට ගමන් කර ඇත. එසේම, මේ වනවිට එම පාශාණ වල අවසාදිත කොටස් පහළ කොටසේ සෑම තැනකම පාහේ නිරීක්ෂණය කළ හැකිය.

ආපදා අවමකරණ ස්ථානයේ මුලු භූමි ප්‍රමාණය 10,000$m^2$ පමණ වේ. මෙම භූමියේ ඉඩම් අයිතිය පුද්ගලික අංශයට අයත් වේ. තවද, 2014 දී සිදුවන ලද විශාල නාය යෑමටත්, 2020 දී සිදුවන ලද කණ්ඩි කඩා වැටීමටත් හේතුව, අධික වර්ෂාපතනය බව ප්‍රදේශවාසීන් අනාවරණය කළෝය.




*රූපය 2 - යෝජිත ආපදා අවදානම්කරණ ස්ථානයේ චන්ද්‍රිකා ඡායාරූපය*

### 2.4. ප්‍රදේශයේ දේශගුණික හා කාලගුණික තත්ත්වය

යටවත්ත ප්‍රදේශයේ දේශගුණික කලාපය සලකා බැලීමේදී, මෙය ස්වභාවික මධ්‍යම කදුකරයෙන් ආවරණය වන අතර මධ්‍යම තෙත් කලාපය තුළ පිහිටයි. එසේම කාලගුණික තත්ත්වය පිළිබඳ සලකා බැලීමේදී, සැප්තැම්බර් සිට ජනවාරි දක්වා ඊසානදිග මෝසම් කාල සීමාව තුළ මිලිමීටර් 1165 ක වර්ෂාපතනයක් පවතී. මෙම ප්‍රදේශය නිරිතදිග මෝසම් කාලයෙන් ද පෝෂණය වන අතර වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 28-36ක් පමණ වේ.
(මූලාශ්‍රය: යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -
http://www.yatawatta.ds.gov.lk/index.php/en/about-us/overview.html )

## 3. නායයෑම් ආපදා සිදුවීම් පිළිබඳ තොරතුරු

### 3.1 පෙර වාර්තා වන ලද සිදුවීම්

NBRO හි දිස්ත්‍රික් නායයෑම් පර්යේෂණ සහ අවදානම් අවම කිරීමේ අංශයේ දත්ත වලට අනුව, පහත සඳහන් ස්ථානය අස්ථායී බෑවුමක් ලෙස හඳුනාගෙන ඇත. (වාර්තා අංකය- NBRO/LRRMD/SPI/ML/14/31/15225).2014 වර්ෂයේ නායයෑමට ගොදුරු වූ ඊ.එම්.කේ.ජී.ලොකුබණ්ඩාර මහත්මියගේ ප්‍රකාශය අනුව, නාය යාමට ප්‍රධාන හේතුව එම වසරේ ඇතිවන ලද අධික වර්ෂාපතනයයි. වැසි ජලය අධික ලෙස කාන්දු වීම නිසා බෑවුම් වල ජලාපවහන කළමනාකරණය දුර්වල වී ගලා යන ජල මාර්ගයේ පීඩනය වැඩි වී ඇත. තවද මෙම ආපදා අවස්ථාවේදී ආසන්න වශයෙන් මීටර් 75 ක් පමණ වූ නාය කිඳාව ඉහළ බෑවුමෙන් ඉවත්වී, මීටර් 150 ක් පමණ පහළ බෑවුම දෙසට චලනය වී ඇත. 2014 දෙසැම්බර් 29 වන දින, මෙම බෑවුම හරහා පාලනය කළ නොහැකි මට්ටමින් මතුපිට ජලය ගලායාම හේතුවෙන් ඉහළ පාංශු ස්ථරයේ සුළු චලනයක් සිදු විය. එසේම, 2020 වර්ෂයේදීද කණ්ඩි කඩාවැටීම් කෙරෙහිද මෙම හේතුවම බලපා ඇත. අපගේ ක්ෂේත්‍ර චාරිකාව අතරතුර, ආපදාව නිසා බාදනයවූ අවසාදිත කොටස් මතුපිටින් දැකගත හැකි විය.




*රූපය 3 - හරස්කඩ, ඉඩම් භාවිතය, අවදානම් ඒකක සහ ස්ථානයේ විශේෂ ලක්ෂණ*

## 3.2. නායයෑමේ බලපෑම් සහ ප්‍රතිවිපාක

අධික වර්ෂා සහිත කාලවලදී අස්ථායී ලෙස කපන ලද බෑවුම හරහා මතුපිටින් ඉවත් වන පාංශු ස්ථරය පහත වැටීම නිසා කණ්ඩි කඩාවැටීම් සිදුවී අසල ඇති නිවාස වලට හානි සිදු විය හැක. නාය යෑමේ තර්ජනයට මුහුණ පා සිටින අධි අවදානම් නිවාස 4කට ආසන්න ප්‍රමාණයක් සහ මධ්‍ය අවදානම් ලෙස හඳුනාගෙන ඇති නිවාස 6කට ආසන්න ප්‍රමාණයක් මෙම ආපදා අවමකරණ ස්ථානය යාබදව ඇත. එසේම මේ හරහා සුන්බුන් ගලායාම නිසා වටිනා ගස් අහිමි වීමේ සහ පරිසරය දූෂණය වීමේ ඉහළ සම්භාවිතාවක් ඇත. තවද නායයෑමට ලක්වූ ස්ථානයේ සිට මීටර් 50 ක් පමණ දුරින් පොළවේ ආතති ඉරිතැලීම් නිරීක්ෂණය කළ හැක.

| අධි අවදානම් | මධ්‍ය අවදානම් |
|---|---|
| 1. ඊ.එම්.කේ.ජී.ලොකුබණ්ඩාර | 5. එම්.ජී.රත්නායක |
| 2. එච්.ජී.රතනප්පු | 6. ප්‍රියන්ත ආරියතිලක |
| 3. එච්.ජී.රත්නායක | 7. අයි.ජී.ධර්මරත්න |
| 4. ඩබ්ලිව්.සරත් හුලංගමුව | 8. අයි.ජී.ගුණරත්න |
| | 9. ඊ.ජී.සේනාරත්න |
| | 10. ටී.ජී.ඒ.එස්.ආර්.වල්පොල |

### 3.3. නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග

නාය යෑම් සිදුවීම වාර්ථා වීමත් සමග, (NBRO) විසින් අදාළ පරිශ්‍රයේ ඇති අස්ථායී බෑවුම පරීක්ෂා කර ඇත. මෙම ස්ථානය තුළ, නායයෑම් වැලැක්වීම සඳහා මේ වන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. එසේම, ජල මට්ටම මැනීම සඳහා සවිකරන ලද පීසෝමීටරයක් බෑවුමේ ඉහළ කොටසේ මේ වන විටත් නිරීක්ෂණය කළ හැකි අතර නිවසේ කොටසක් අලුත්වැඩියා කර ඇති බව නිරීක්ෂණය විය.

### 3.4. පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීම

අස්ථායී බෑවුමට ආසන්නවම පදිංචිව සිටින ලොකු බණ්ඩාර මහත්මිය සහ අනෙකුත් පවුල් 3 අධි අවදානම් නිවාස ලෙස හඳුනාගෙන ඇති අතර, අධික වැසි දිනවලදී එම ප්‍රදේශයෙන් තාවකාලිකව ඉවත් වන ලෙස ඔවුන්ට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේදී, ලොකුබණ්ඩාර මහත්මියගේ පවුලේ අය එම ස්ථානයෙන් තාවකාලිකව ඉවත් වීම අත්‍යාවශ්‍ය වේ. ඊට අමතරව, එම ස්ථානයේ නායයාමේ අවදානම අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා පදිංචිකරුවන් මෙම ස්ථානයෙන් ඉවත් කිරීමක් අවශ්‍ය නොවේ.

### 3.5. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය (ප්‍රගතිය)

අවදානම් නිවාස අංක 04 පෙර නායයෑමෙන් පසු වහාම නැවත පදිංචි කරන ලෙසට උපදෙස් දී ඇතත්, තවමත් ඔවුන් කිසිවකු නැවත පදිංචි කර නොමැති අතර අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියකට යාමට අවශ්‍ය නොවීය.




*රූපය 4 : අවම කිරීමේ ස්ථානයහි හරස්කඩ, ඉඩම් පරිහරණය සහ මූලික තොරතුරු*

## 4. බෑවුම් අස්ථායී වීම සිදුව ඇති ප්‍රදේශය හා ආසන්න ප්‍රදේශය පිළිබඳ විස්තරය සහ වර්තමාන අවදානම් මට්ටම

### 4.1. බෑවුම් අස්ථායී ප්‍රදේශය ආශ්‍රිත පරිසරය

ව්‍යාපෘති භූමිය නගරයට දුරස්ථ ප්‍රදේශයක පිහිටා ඇති බැවින්, විසිරුණු ග්‍රාමීය ජනාවාස සහ එහි ලක්ෂණ නිරීක්ෂණය කළ හැක. මෙම ස්ථානය අවට ප්‍රදේශය ගැන සලකා බැලීමේදී, එම ස්ථානයේ සිට මීටර් 500ක අරය ඇතුළත විසිරුණු ජනාවාස, ගෙවතු සහ ඝන ගස් සහිත වනාන්තර ප්‍රදේශ නිරීක්ෂණය කළ හැකිය. තවද, මීට යාබදව කිසිදු වාණිජ හෝ පරිපාලන ප්‍රදේශයක් නිරීක්ෂණය කළ නොහැක.

බලපෑමට ලක් වූ මෙම ස්ථානය පහළ වල්පොල මාර්ගයේ පිහිටා ඇත. සාදික්කා, කරාබු නැටි, පුවක් සහ මැංගුස් වැනි ඝන කෘෂිකාර්මික වැවිලි බෝග මෙම ප්‍රදේශය තුල වැඩි වශයෙන් දැකිය හැකි අතර,මෙම ප්‍රදේශයේ වෙසෙන බහුතරයක් පවුල්වල ප්‍රාථමික හෝ ද්විතියික ආදායම් මාර්ගය මෙම බෝග හරහා ලබාගන්නා ආදායම වේ.

මෙම ආපදා අවමකිරීමේ ස්ථානය විසිරුණු හා රේඛීයව නිර්මිත පරිසරයක පිහිටා ඇති අතර, විශේෂයෙන් දේවාලේ වත්ත පාර දෙපස නිවාස කීපයක්ම දැකිය හැකි වේ. වල්පොල විහාරය හැරුණු විට, අවම කිරීමේ ස්ථානය අසල කිසිදු විශේෂිත භූ සලකුණක් හෝ ස්මාරකයක් නොතිබුණි.

### 4.2. වර්තමාන අවදානම් මට්ටම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිලධාරීන් එම ස්ථානය පරීක්ෂා කර ඇති අතර එහිදී නිවාස 4ක් අධි අවදානම් ලෙස සහ නිවාස 6ක් මධ්‍ය අවදානම් ලෙස හඳුනාගෙන ඇත. පාෂාණ වැටීම් මෙම පරිසරයේ බහුලව දැකිය හැකි අතර පාංශු හා සුන්බුන් ගලායාම නිසා ආසන්න නිවාසවලට හානි පමුණුවයි. තවද, එම පවුල් ඔවුන්ගේ ජීවනෝපාය මාර්ගය ලෙස වගා කරන බෝගද නායයෑම් නිසා විනාශයට පත්වේ.

## 5. ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අවදානම් අවමකරණ ක්‍රම

යෝජිත ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ නායයාම තවදුරටත් ඇතිවීම වැලැක්වීම වන අතර, බෑවුමේ පිහිටා ඇති නිවාස සහ කෘෂිකාර්මික ඉඩම් නාය යෑමේ ඉහළ විභවතාවක් ඇති නිසා රැඳවුම් බැම්,පාංශු වැරගැන්වුම් , බෑවුම නැවත සකස් කිරීම , මතුපිට තෘණ වැවීම , මතුපිට සහ භූගත ජලාපවහන කළමනාකරණය යනාදී ආපදා අවදානම වැළැක්වීමේ පියවරයන් ක්‍රියාත්මක කෙරේ.

## 6. ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑම් සිදුවිය හැකි සංරචකයන්

බලපෑමට ලක් වූ ස්ථානය පහළ වල්පොල මාර්ගය තුළ පිහිටා ඇති අතර ගොඩනැගිලි විවිධ උස මට්ටම් වලින් පිහිටා ඇත. ඒ අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් අවදානමට ලක්විය හැකි සංරචකයන් පහත පරිදි දැක්විය හැකිය.

- පහළ බෑවුමේ පිහිටා ඇති නිවාස
- වෘක්ෂලතා සහ ගෙවතු
- විදුලි රැහැන් සහ ජල සැපයුම් මාර්ගය

| | |
|---|---|
|  |  |
| *රූපය (05 අ) -මෙම ස්ථානයේ පහළ බෑවුමේ පිහිටා ඇති ලොකුබණ්සාර මහත්මියගේ නිවස.* | *රූපය 05 (ආ) -මෙම ස්ථානයේ පහළ බෑවුමේ පිහිටා ඇති එච්.ජී. රත්නප්පු මහතාගේ නිවස* |
|  |  |
| *රූප සටහන 05 (ඇ) - නාය යෑමේ තර්ජනයට ලක් වූ ඉහළ බෑවුමේ පිහිටි ගෙවත්ත.* | *රූප සටහන 05 (ඈ) - නාය යෑමේ තර්ජනයට ලක් වූ ඉහළ බෑවුමේ පිහිටි වෘක්ෂලතා ආවරණය.* |

*රූපය 5 - : ව්‍යාපෘති කටයුතු හේතුවෙන් බලපෑමට ලක්විය හැකි සංරචකයන්*

## 7. සිදුවිය හැකි සමාජයීය හා පාරිසරික බලපෑම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම

### 7.1. ව්‍යාපෘතියෙන් සිදුවන සාධනීය බලපෑම

යෝජිත ව්‍යාපෘති ක්‍රියාකාරකම් මගින් අස්ථායී බෑවුම පිළිසකර කිරීම සඳහා කටයුතු කෙරේ. එම ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලින් අපේක්ෂිත සාධනීය බලපෑම පහත පරිදි දැක්විය හැකිය.

- මෙම ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රදේශයේ බෑවුම් අස්ථාවර වීම තවදුරටත් පැතිරියාම අවම කිරීමක් සිදුවන අතර එය බෑවුමේ පහළ ප්‍රදේශයේ පදිංචි පවුල්වල ආරක්ෂාව වැඩි කරනු ඇත.
- ප්‍රදේශයේ නිවාසවල සිදුකරන බෝග වගාව සහ අනෙකුත් ජීවනෝපායන් නාය යෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග හරහා බොහෝ දුරට ප්‍රතිලාභ ලබයි. ප්‍රදේශයේ බහුතරයක් වෘක්ෂලතාවන්ගෙන් සහ ගෙවතු වගාවන්ගෙන් වැසී ඇති බැවින් කණ්ඩි කඩා වැටීම අවට ජනතාවගේ ආර්ථිකය අහිමි වීමට හේතු වේ. අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හරහා එම පවුල්වල ආදායම සුරක්ෂිත කිරීමට උපකාරී වේ.

### 7.2. අහිතකර බලපෑම

මෙම ව්‍යාපෘතියෙන් යෝජිත ආපදා අවදානම් අවමකරණ පියවරයන් බෑවුම් අස්ථායී වීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ප්‍රදේශයට පමණක් අදාළව ක්‍රියාත්මක කරනු ලබයි. එබැවින් ව්‍යාපෘතියෙන් ඇතිවන අහිතකර බලපෑම් මෙම ස්ථානයට හා ඉදිකිරීම් කාලසීමාවට පමණක් සීමා වේ.

වගුව 1 - අහිතකර බලපෑම් සහ බලපෑම්වල තීව්‍රතාවය

| ඉදිකිරීම් කාලය අතරතුර සිදුවන බලපෑම් | බලපෑමේ තීව්‍රතාව |
|---|---|
| **7.2.1 ජල විද්‍යාත්මක හා ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම** | |
| **7.2.1.1 ප්‍රදේශයේ ජලාපවහන රටාවේ බලපෑම්**<br><br>මේ ප්‍රදේශයේ නිසි ජලාපවහන රටාවක් නොපවතින අතර මේ ප්‍රදේශයේ නිසි ජලාපවහන රටාවක් නොපවතින අතර දැනට පවතින ජලාපවහන සහ මතුපිට ජලය ගලා යන ප්‍රවාහ මාර්ග හැරවීමෙන් ප්‍රදේශයේ පවතින මතුපිට සහ උප මතුපිට ජලාපවහන රටාවට බාධා ඇති කරයි.මෙම ස්ථානයේ අවම කිරීමේ කටයුතු බොහෝ දුරට ජලාපවහන වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර ජල මාර්ග හැරවීම්, කපා හැරීම සහ භූගත ජලාපවහනය වැඩිකිරීම ආදිය හේතුවෙන් වර්ෂා කාලවලදී මෙම භූමියේ වැඩි ප්‍රවේශයකින් ජලය ගලායාම සිදු වේ. එබැවින්, මෙම ස්ථානයට වැසි දිනවල ක්‍රියාත්මක කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග අත්‍යාවශ්‍ය වනු ඇත. | **වැදගත්** |
| **7.2.1.2 ජල දූෂණ බලපෑම්**<br><br>මෙම අවම කිරීමේ ස්ථානයට ආසන්නව ජල මූලාශ්‍රයන් නොපවතී. | **නොවැදගත්** |
| **7.2.1.3 ඛාදන බලපෑම්**<br><br>මෙම භූමියේ සිදුකරන ආපදා අවමකරණ කිරීමේ ක්‍රියාමාර්ග බොහෝ දුරට ජලාපවහනය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එබැවින් වැසි සමයේදී අධික ජල ප්‍රවාහයක් ජනනය වීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ක්‍රියාවන් අතරතුර ශාක/තෘණ ආවරණය ඉවත් කිරීම සහ කැණීම් කටයුතු අපේක්ෂා කළ හැක. තවද මෙම ස්ථානය ප්‍රපාතාකාර බෑවුමකින් සමන්විත වන බැවින්, නිසි ආවරණයක් නොතැබුවහොත්, ඉහළ පාංශු ස්ථරය අධික ලෙස ඛාදනය වීමෙන් යාබද නිවාස වලට සහ ගෙවතු වලට බලපෑම් ඇති විය හැක. | **ඉතා වැදගත්** |
| **7.2.1.4 විවෘත මලපහ කිරීම් සහ ජලය ආශ්‍රයෙන් පැතිරිය හැකි රෝග තත්ත්වයන්**<br><br>ආපදා අවම කිරීමේ ස්ථානය විවෘත හා නේවාසික ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති | **නොවැදගත්** |

| | |
|---|---|
| බැවින් විවෘත මලපහ කිරීම්වලට යොමු වීමේ අවම සම්භාවිතාවක් පවතී. | |
| **7.2.1.5 පහළ බෑවුමේ ජල මූලාශ්‍ර භාවිත කරන්නන්ට සිදුවිය හැකි බලපෑම**<br><br>මෙම අවම කිරීමේ ස්ථානයට ආසන්නව ජල මූලාශ්‍රයන් නොපවතී. | **නොවැදගත්** |
| **7.2.1.6 භූගත ජල මට්ටමට සහ ජලයේ ගුණාත්මකභාවයට සිදුවන බලපෑම**<br><br>බෑවුම් ප්‍රදේශයේ සිදු කෙරෙන අවමකරණ ක්‍රියාකාරකම් හේතුවෙන් භූගත ජල මට්ටම පහත වැටීමේ අවධානමක් නොපවතී. | **නොවැදගත්** |
| **7.2.1.7 ජලය හෝ තෙත් බිම් මත ඇති වන බලපෑම්**<br><br>අවම කිරීමේ ස්ථානයට ආසන්නව තෙත් බිමක් දැකගත නොහැක. | **නොවැදගත්** |
| **7.2.2 පාරිසරික බලපෑම** | |
| **7.2.2.1 ශබ්ද දූෂණය, කම්පනය, පිපිරවීම, ඉදිකිරීම් අතරතුර ඇති වන බලපෑම්, ගොඩනැගිලිවලට විය හැකි හානිය හා යටිතල පහසුකම්**<br><br>ව්‍යාපෘති කටයුතු සිදුකිරීමේදී ඉදිකිරීම් උපකරණ වලින් ශබ්දය සහ කම්පනය අපේක්ෂා කළ හැකි අතර වැඩබිමට ආසන්න පදිංචිකරුවන්ගේ නිවාස වලට එම ශබ්දවල බලපෑම බහුලවම ඇති කරනු ඇත. තවද, ඉදිකිරීම් කටයුතු අතරතුර ඇතිවන කම්පන තත්වයන් නිසා  පහළ බෑවුමේ ඇති ගොඩනැගිලිවල (නිවාසවල) ස්ථාවරත්වයට බලපෑම් කළ හැකි අතර ගොඩනැගිලිවල ඉරිතැලීම් ඇති විය හැක. | **ඉතා වැදගත්** |
| **7.2.2.2 වායු දූෂණ බලපෑම**<br><br>මෙම වැඩබිම තුල ඉඩම් පිරිසිදු කිරීම, ඩීසල් එන්ජින් ක්‍රියාත්මක කිරීම, ව්‍යුහයන් කඩා ඉවත් කිරීම සහ ගිනි තැබීම වැනි වායු දූෂණයට දායක වන ඉදිකිරීම් ක්‍රියාකාරකම් සිදුවේ. තවද, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ වැරදි ලෙස හැසිරවීම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය නිසියාකාරව ගබඩා නොකිරීම නිසා දූවිලි අංශු ජනනය විය හැකිය. ඉදි කිරීම් අතරතුර, කොන්ක්‍රීට්, සිමෙන්ති, ලී, ගල් සහ සිලිකා වැනි ද්‍රව්‍ය වලින් සාමාන්‍යයෙන් ඉහළ ප්‍රමාණයක දූවිලි ජනනය කරයි. එසේම, පදිංචිකරුවන් සහිත නිවාස කීපයක් මෙම ස්ථානයට ඉතා ආසන්නව පිහිටා ඇති අතර දූවිලි හා දූෂිත වායූන් හේතුවෙන් එහි ජීවත් වන වැඩිහිටියන් හා ළමුන් අවදානමට ලක්විය හැක. එබැවින් මෙම වැඩබිම තුල වියළි කාලයේදී වායු දූෂණයේ බලපෑම ඉහල විය හැක. | **ඉතා වැදගත්** |
| **7.2.2.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලු**<br><br>ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමෙන් ජලය සහ පස දූෂණය විය හැකි අතර ඉදිකිරීම් කාලය තුළ අපද්‍රව්‍ය නිසි බැහැර කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවන්නේ නම් විවිධ පාරිසරික බලපෑම් ඇති කළ හැකිය. ඉදිකිරීම් කාලය තුළ නිසි ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ යාන්ත්‍රණයක් භාවිතා නොකළහොත් බලපෑම සැලකිය යුතු ය. | **ඉතා වැදගත්** |
| **7.2.2.4 පිපුරුම් සහ අන්තරායකර ද්‍රව්‍ය**<br><br>බලපෑමට ලක් වූ ප්‍රදේශයේ විශාල පාෂාණ කීපයක් ඇති බැවින්, පාෂාණ පිපිරවීම අපේක්ෂා කරන්නේ නම් පුපුරණ ද්‍රව්‍ය භාවිතා කළ හැකිය.නමුත්, අනාරක්ෂිත භාවිතය හේතුවෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවට, මගීන්ට සහ ඉදිකිරීම් කටයුතු වල නියැලෙන ශ්‍රම බලකායට මෙය අවදානමක් විය හැකිය. මෙම ක්‍රියාවලීන් අස්ථායී බෑවුම් මත සිදු කිරීමට නියමිත බැවින් පුපුරණ ද්‍රව්‍ය අනිසි ලෙස භාවිතා කිරීම තුලින් පාෂාණ කැබලි විසිරී යාමෙන් සිදුවන අනතුරු පිළිබඳ සලකා බැලීම ඉතා වැදගත් වේ. | **ඉතා වැදගත්** |
| **7.2.3 පරිසර විද්‍යාත්මක බලපෑම** | |

| | |
|---|---|
| **7.2.3.1 වැදගත් වනජීවී වාසස්ථානයන්ට සිදුවන බලපෑම**<br><br>යෝජිත අවදානම් අවමකරණ ස්ථානය තුළ ඉහළ ජෛව විවිධත්වයක් හෝ සත්ව වාසස්ථාන සහිත වනාන්තර හෝ වනජීවී රක්ෂිත නොපවතින බැවින් ඒ පිලිබඳ වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය නොවේ. | **නොවැදගත්** |
| **7.2.3.2 ශාක ව්‍යාප්තියට සිදුවන බලපෑම**<br><br>මෙම පරිසරයේ දක්නට ලැබෙන බොහෝ ශාක වර්ග ආවේණික, තර්ජනයට ලක්වූ හෝ IUCN මගින් රතු දත්ත ලැයිස්තුවට ඇතුළත් කරන ලද ශාක නොවේ. | **නොවැදගත්** |
| **7.2.4 සමාජ ආර්ථික බලපෑම** | |
| **7.2.4.1 ආපදා අවදානම අවම කිරීමේ ප්‍රදේශය තුළ කෘෂිකර්මාන්තයට සිදුවන බලපෑම්**<br><br>අවම කිරීමේ ස්ථානය තුල සාදික්කා, කරාබු නැටි, පුවක් සහ මැංගුස් වැනි වැවිලි බෝග වගා කර ඇති අතර ඒවා ලොකුබණ්ඩාර මහත්මියගේ හිමිකාරීත්වය යටතේ පවතී. ඉදිකිරීම් කටයුතු වලදී මෙම වෘක්ෂලතා ඉවත් කිරීමට සිදුවන අතර එමගින් වැවිලිකරුවන්ගේ ආදායම් ඉපැයීම කෙරෙහි බලපානු ඇත. | **ඉතා වැදගත්** |
| **7.2.4.2 කම්පන බලපෑම් හේතුවෙන් ගොඩනැගිලි වල ඇතිවන ඉරිතැලීම්**<br><br>ඉදිකිරීම් කටයුතු වලදී ඇතිවන කම්පනය හේතුවෙන් අවම කිරීමේ ස්ථානයට ඉතා ආසන්නව පහළ බෑවුමේ පිහිටා ඇති නිවාස වල ස්ථාවරත්වයට විශාල බලපෑමක් ඇතිවිය හැකිය. | **ඉතා වැදගත්** |
| **7.2.4.3 සේවා සැපයීම කෙරෙහි වන බලපෑම් (ජල සැපයුම, අපජලය, විදුලිය)**<br><br>විදුලි රැහැන් හා ජල සැපයුම් මාර්ගයට හානි සිදුවීමේ හැකියාවක් පවතී. ඒ සමගම, ඉදිකිරීම් කටයුතු වලදී සහ යන්ත්‍රෝපකරණ චලනය කිරීමේදී ජලනල මාර්ග වලට බාධා හෝ හානි ඇති විය හැක. | **වැදගත්** |
| **7.2.4.4 යටිතල පහසුකම් සහ ආරක්ෂාව අහිමි වීම හේතුවෙන් වන බලපෑම්**<br><br>බොහෝ ඉදිකිරීම් කටයුතු තල්ගොඩපිටිය - යටවත්ත - දොඹවෙල පාරේ (B409) සිට මීටර් 650 කට ආසන්න දුරකින් පිහිටි ලොකුබණ්ඩාර මහතාගේ නිවසට යාබද අස්ථායී බෑවුම් ප්‍රදේශය වෙත යොමු කෙරේ. කෙසේ වෙතත්, ඉදිකිරීම් අදියරේදී මාර්ගයේ තාවකාලික අවහිරතා ඇති විය හැකිය. මෙය සතියේ දිනවල, පාසල් වේලාවන්හි, (උදෑසන, දිවා කාලයේ සහ සවස) වාහන ගමනාගමනයට බාධාවක් වනු ඇත. මෙමගින් පදිකයින්ට සහ මගීන්ට අපහසුතාවයක් ඇති වේ. | **වැදගත්** |
| **7.2.4.5 ඉදිකිරීම් අතරතුර පිටස්තර පුද්ගලයින් පිවිසීමේ අවදානම**<br><br>මිනිසුන් සහ පදිකයින් මෙම පරිශ්‍රය හරහා ගමන් කරන අතර ඉදිකිරීම් කටයුතු සඳහා කැණීම් යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදිය භාවිතා කෙරේ. ඇතැම් යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ස්ථානය තුල අධි වෝල්ටීයතා විදුලිබලය භාවිතා කළ හැක. නුසුදුසු ගබඩා කිරීම සහ හැසිරවීමේ අක්‍රමිකතා නිසා හානිකර ලෝහ එකතු කිරීම් වන වානේ වැනි ද්‍රව්‍ය භාවිතා කළ හැකිය. මිනිසුන් ඇතුළුවීම පිළිබඳ නොදැනුවත්කම සහ යන්ත්‍රෝපකරණ නොසැලකිලිමත් ලෙස ක්‍රියාත්මක කිරීම නිසා පුද්ගලයින්ට මාරාන්තික තුවාල හා අනතුරු ඇති කළ හැකිය. | **වැදගත්** |

| | |
|---|---|
| **7.2.4.6 කඳවුරු භූමිය සහ අනෙකුත් අවශ්‍යතා**<br><br>ලොකුබණ්ඩාර මහත්මිය ඔවුන්ගේ හිස් ඉඩම ස්ථානීය කඳවුරු සෑදීම සඳහා ලබා දීමට එකඟ විය. නිසි කඳවුරු කළමනාකරණයක් ක්‍රියාත්මක නොවන්නේ නම්, කම්කරු ප්‍රශ්න, ප්‍රජාව සහ නිලධාරීන්ගේ සමාජ ගැටලු, ආරවුල් සහ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු යනාදිය ඇති විය හැකිය. එම ස්ථානයට ආසන්නයේ තාවකාලික කඳවුරු ඉදිකරන්නේ නම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ අපද්‍රව්‍ය බැහැර කිරීම ගැටලුවක් විය හැක. මෙම පරිශ්‍රයේ සිට සේවකයන්ට අවශ්‍ය ජලය සහ අනෙකුත් පහසුකම් සැපයීම සඳහා අදාළ පාර්ශ්වයන්ගේ අවසරය ලබාගත යුතුය. | **ඉතා වැදගත්** |
| **7.2.4.7 වැඩබිම අවට ජීවත් වන පුද්ගලයින් හා කම්කරුවන් අතර සබඳතා සහ ආරවුල් ඇතිවීමේ හැකියාව**<br><br>අවම කිරීමේ ස්ථානයට යාබදව නිවාස 10 ක් ඇති බැවින් ඉදිකිරීම් භූමියේ කම්කරුවන් හා ගම්වාසීන් අතර ආරවුල් ඇති වීමේ වැඩි සම්භාවිතාවක් පවතී. | **වැදගත්** |
| **7.2.4.8 ඉදිකිරීම් අතරතුර ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව**<br><br>වැඩබිම් ශ්‍රමිකයින් වැටීම් නිසා සිදුවන අනතුරු සඳහා නිරාවරණය වීමේ වැඩි ප්‍රවණතාවක් ඇත. වැසි සමයේදී එසේ අනතුරු සිදුවීමේ හැකියාව ඉහළ වන අතර, ඉතා සීමිත ඉඩකඩක් තුළ ඉදිකිරීම් යන්ත්‍ර භාවිතය සිදු කිරීම නිසා මෙම වැඩබිම තුළ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සහ රථවාහන අනතුරු ඇති වීමේ ඉහළ අවදානමක් පවතී. කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සඳහා ළමා ශ්‍රමිකයින් යොදා ගතහොත් එය දැඩි අවදානම්කාරී හා අනතුරුදායී කටයුත්තක් බවට පත්වේ. | **වැදගත්** |
| **7.2.4.9 මාර්ග ගමනාගමනය සහ ඉදිකිරීම් කටයුතු වලින් මහජනතාවට ආරක්ෂාව සැපයීම**<br><br>ඉදිකිරීම් අදියරේදී නිතර ගමන් කරන යන්ත්‍රෝපකරණ, ලෝඩර්, ට්‍රක් රථ ආදියෙන් මාර්ග වල ගමනාගමනයට බාධා ඇති වේ. එසේ වුවද, අවම කිරීමේ ස්ථානය ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ සිට මීටර් 650 ක් දුරින් පවතින අතර රථවාහන මට්ටම හෝ වාහන ගමනාගමනයට බාධා කිරීම සාපේක්ෂව අඩුය. අවම කිරීමේ කටයුතු බොහෝමයක් බෑවුම්වල සීමිත ඉඩක් තුළ සිදු කිරීමට නියමිත බැවින් බර යන්ත්‍ර, ට්‍රක් සහ ලෝඩර් ආදිය පදික ගමනට බාධා කළ හැකි අතර ඔවුන්ගේ ජීවිතවලට දැඩි අවදානමක් ඇති කළ හැකිය. | **වැදගත්** |

## 8. සැලකිය යුතු පාරිසරික සහ සමාජීය බලපෑම්

NBRO හි විශේෂ අවධානයක් යොමුවන වන පාරිසරික, සමාජීය බලපෑම් හෝ අවදානම් පහත පරිදි දැක්විය හැක.

### 8.1 මූලික සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු: කොන්ත්‍රාත්කරුවන් සඳහා සම්මත ගිවිසුම් අවශ්‍යතාවන්ට අමතරව විශේෂිත සෞඛ්‍ය හා ආරක්ෂණ නිර්දේශයන්

බෑවුම් කඩා වැටීමේ අවදානමක් සහිත අස්ථායී බෑවුමකට ආසන්නව ශ්‍රමිකයින්ට වැඩ කිරීමට සිදු වන බැවින් මෙම වැඩබිමට අදාළව සෞඛ්‍ය සහ ආරක්ෂිත ගැටළු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුවේ. එබැවින් එකී පොදු සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටලු ESMF හිදී අවධානයට ලක්කර ඇත. ඉදිකිරීම් වැඩබිම්වලදී ශ්‍රමිකයින්ගේ ආරක්ෂණ අවශ්‍යතා පිලිබඳ ව 2003 දරණ සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ නිර්දේශ දක්වන ලංසු ලේඛනයේ 2003(5) වගන්තිය යටතේ ආරක්ෂිත උපාංග සහ පැළඳුම් පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

### 8.2 ළමා හා බලහත්කාර ශ්‍රමය

2003 දරණ සේවා කොන්දේසි, ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ නිර්දේශ දක්වන ලංසු ලේඛනයේ 2003.3 වගන්තිය යටතේ ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය පිලිබඳ සවිස්තරාත්මකව දක්වා ඇත.

## 9. පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ESMP)

මෙම කොටස යටතේ පෙර 7 හා 8 අංශ වලදී හඳුනාගන්න ලද බලපෑම් සහ අවදානම් කළමනාකරණය හෝ අවමකරණය සඳහා අවශ්‍ය පාරිසරික හා සමාජීයීය පියවර හා නිශ්චිත නිර්දේශයන් ඉදිකිරීම් ක්‍රියාවලියේ ප්‍රධාන අදියරයන් වන සැලසුම් අදියර, ඉදිකිරීම් අදියර සහ නඩත්තු මෙහෙයුම් අදියර යටතේ අන්තර්ගතකර ඇත.

### 9.1 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම

මෙම ආපදා අවදානම අවමකරණ ස්ථානය තුළ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක අවශ්‍යතාවක් නොපවතින අතර බරයන්ත්‍රෝපකරණ ක්‍රියාකාරීත්වය නිසා ඇතිවන භූ කම්පනය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාවන් වලදී ගොඩනැගිලිවලට ව්‍යුහාත්මක හානි ස්වරූපයෙන් යම් බලපෑම් ඇති විය හැක. තවද ව්‍යාපෘතිය හේතුවෙන් ගොඩනැගිලි වල ව්‍යුහයන්ට හානි සිදුවුවහොත් වන්දි ගෙවීමේ ක්‍රියාවලියක් සකස් කළ යුතු අතර (පරිශීලනය (2002.2.17)) උපයෝගිතා සේවා සහ අනෙකුත් පහසුකම් පිලිබඳව ESMP හරහා අවධානය යොමුලකළ යුතුවේ.

### 9.2 තාවකාලිකව ඉවත් කිරීම

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ, නාය යාමේ ස්ථානයට යාබදව ඇති ඊ.එම්.කේ.ජී.ලොකුබණ්ඩාර මහතාගේ අධි අවදානම් නිවස සහ පහළ බෑවුමේ පිහිටි අනෙකුත් අධි අවදානම් නිවාස 3 ඉවත් කිරීමට අවශ්‍ය විය හැකිය. ලොකුබණ්ඩාර මහත්මිය සහ රත්නප්පු මහතාගේ ප්‍රකාශවලට අනුව ඉඩම් හිඟය සහ ජීවනෝපාය හේතුවෙන් ඔවුන් එම ස්ථානයෙන් ඉවත් වීමට කැමැත්තක් නොදක්වයි. එබැවින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය අතරතුර,මෙම ස්ථානයෙන් තාවකාලිකව ඉවත් කිරීම අත්‍යාවශ්‍ය වන අතර, ඉදිකිරීම් කාලය සඳහා පහළ බෑවුම "ඇතුල්වීම් තහනම් කලාපයක්" ලෙස නම් කළ යුතුය.ඒ හැරුනු විට අනෙකුත් මධ්‍යම අවදානම් නිවාස 6 තාවකාලිකව ඉවත් කිරීමේ ක්‍රියාවලියකට යොමු කිරීමට අවශ්‍ය නොවේ.

### 9.3 හානියට පත් ඉදිකිරීම් ව්‍යුහයන් ඉවත් කිරීම (අබලි ද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව ඉඩම් හිමිකරුවන්ගේ නිර්දේශ ලබා ගැනීම)

ආපදා අවමකරණ ප්‍රදේශය තුල හානියට පත් ඉදිකිරීම් ව්‍යුහයන් ඉවත් කිරීම හෝ අබලි ද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධ අවදානම් ඇතිවීමේ හැකියාවක් නොපවතී.

### 9.4 ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් දේපළ හා භාවිතයන් අහිමි වීම වෙනුවෙන් වන්දි ගෙවීම

ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් හේතුවෙන් යම් නිවාසයකට හානි සිදුවුවහොත් ඊට අදාළ වන්දි ලබා දීම අත්‍යාවශ්‍ය වේ. ලොකුබණ්ඩාර මහත්මියගේ ප්‍රකාශයට අනුව, ඉහළ බෑවුම් ප්‍රදේශයේ සාදික්කා පැල 50කට ආසන්න ප්‍රමාණයක් පිහිටා තිබුණත්, අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ඉන් කොටසක් ඉවත් කිරීමට ඔවුන්ගේ විරෝධයක් නැත.

### 9.5 මහජනතාව දැනුවත් කිරීම සහ අධ්‍යාපනය - පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වේ

විශේෂයෙන් නාය යෑම් හේතුවෙන් ඇති විය හැකි අවදානම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකළ යුතුය.

## 9.6 පිරිසැලසුම් පදනම් කරගත් පාරිසරික/සමාජයීය කළමනාකරණය

මෙම වැඩබිමෙහි පාරිසරික හා සමාජයීය සාධක මත පදනම්ව පහත සඳහන් පාරිසරික හා සමාජයීය පිරිසැලසුම් යෝජනා නිර්දේශ කරනු ලැබේ.

*වගුව 2 - පිරිසැලසුම් අදියරයේදී පාරිසරික සමාජයීය නිර්දේශ*

| පිරිසැලසුම් අවස්ථා | මෙම වැඩබිම සඳහා සලකා බැලිය යුතු මට්ටම |
|---|---|
| i. **ස්වභාවික සම්පත් කළමනාකරණය සහ සම්පත් උපරිම උපයෝජනය කිරීමේ සැලසුම්**<br>ව්‍යාපෘති පිරිසැලසුම්කරණයේදී එම භූමියේ ඇති වෘක්ෂලතාදිය ඉවත් කිරීම වැලැක්වීමට හෝ අවම වශයෙන් ඉවත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එසේම විශේෂිත හෝ ආවේණික ශාක හඳුනාගතහොත් එවැනි ශාක සංරක්ෂණය කිරීමට විශේෂ අවධානයක් යොමු කළ යුතුය. | ඉහළයි |
| ii. **වැඩබිම් සැලසුම්කරණය**<br>වැඩබිම සැලසුම් කිරීමේදී නාය යෑම් නැවත සක්‍රීය වීම හැකියාවක් පවතීද යන්න සහ සුන්බුන් ජනනය වීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. තවද, වාහන නැවැත්වීම, ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම් හෝ තාවකාලික වාසස්ථාන ආදිය සඳහා අවදානම් කලාපය භාවිත නොකළ යුතුය. | ඉහළයි |
| iii. **වාසස්ථාන සහ සතුන්ගේ ගමන් මාර්ග**<br>ස්ථිර ව්‍යුහ, ප්‍රවේශ මාර්ග වැනි යම් ඉදිකිරීමක් හේතුවෙන් විශාල ප්‍රදේශයක වන ව්‍යාප්තිය ඉවත් කිරීමට සිදු වන්නේ නම් සහ ඒ හේතුවෙන් සතුන්ගේ වාසස්ථාන හා ගමන් මාර්ග හෝ වාරි ඇළවල් වලට හෝ අවහිරයක් වන්නේ නම්, එහි බලපෑම සීමිත ප්‍රදේශයකට වුවත් ඒ සඳහා සත්ව මංපෙත්, තීරු ක්‍රමයට ශාක සිටුවීම් ආදී යෝග්‍ය ක්‍රම අනුගමනය කළ යුතුයි. | ඉතා පහළයි |
| iv. **ජල සම්පත් සංරක්ෂණය**<br>අවදානම් අවමකරණ පියවරක් වශයෙන් මෙම මෙම භූමියෙන් භූගත ජලය ඉවත් කරන්නේ නම් සහ එම ජලය ප්‍රමාණාත්මකභාවයෙන් හා ගුණාත්මකභායෙන් ඉහළ නම්, පහළ බෑවුම ආසන්නයේ සිටින පදිංචිකරුවන්ට ගෙවතු වගාව සහ සනීපාරක්ෂක කටයුතු වැනි භාවිතය සඳහා ජල මූලාශ්‍රයක් ලෙස සැලකිය හැකිය. යෝජිත අවම කිරීමේ ස්ථානයට ආසන්නව පූතිගත ටැංකියක් පිහිටා ඇති බැවින් ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය. | පහළයි |
| v. **ජල සැපයුමට බාධා ඇතිවීම**<br>පහළ බෑවුම් ප්‍රදේශයට ජලය සපයන ජල මාර්ග මෙම අස්ථායී බෑවුම හරහා ගමන් කරයි | පහළයි |
| vi. **සෞන්දර්යාත්මක නිර්මාණ සලකා බැලීම්**<br>සෞන්දර්යාත්මක සංවේදී පරිසර වලට ගැලපෙන පරිදි සැලසුම් කිරීමේදී, දෘශ්‍ය දූෂණය අවම මට්ටමක තබා ගැනීම සඳහා ස්වභාවික පරිසරය සමඟ මුසු වන ව්‍යුහයන් පිළිබඳ වැඩි අවධානයක් යොමුකළ යුතුය. එහිදී එම පරිසරයට වඩාත් ගැලපෙන අවම කිරීමේ ව්‍යුහයන් සැලසුම් කිරීම සඳහා භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සේවය ලබා ගත හැක. | ඉහළයි |
| vii. **හරිත පාරිසරික ලක්ෂණ පිළිබඳ සලකා බැලීම**<br>අවමකරණ ක්‍රියාමාර්ග බොහොමයක් හොඳන් නඩත්තු කරන ලද පරිශ්‍රයන්හි සිදු කෙරෙන බැවින්, පිරි සැලසුම් වලදී හැකිතාක් හරිත පාරසරික ක්‍රමවේද හා බැඳුණු අවදානම් අවමකරණ පියවරයන් සලකා බැලීමට නිර්දේශ කෙරේ. උදා. ඛාදනය පාලනය කිරීම සඳහා දේශීය ශාක භාවිතා කිරීම, පරිසරයේ ජෛව විවිධත්වය පවත්වාහගැනීම සඳහා ශාක සයෝජනය කිරීම, ආක්‍රමණික විශේෂ ඇතුල්වීම වැලැක්වීම | ඉහළයි |

| | |
|---|---|
| viii. **ශ්‍රමිකයින්ගේ/ මගීන්ගේ සහ ප්‍රජාවගේ ආරක්‍ෂාව**<br><br>ඉදිකිරීම් අතරතුර බෑවුම් අස්ථාවර වීම් සිදුවිය හැකි බැවින් වැඩබිම් ශ්‍රමිකයින්ට, ආසන්න නිවාසවල පදිංචි පුද්ගලයින්ට අවදානමක් පවතී. එබැවින් ආරක්‍ෂිත තැනි (Berms) ලආරක්‍ෂිත දැල් (Safety nets) සහ ආරක්‍ෂිත වැටවල් (Safty Fence) වැනි ආරක්‍ෂිත ක්‍රමවේදයන් පිරිසැලසුම්කරණයේදී අවධානය යොමු කළ යුතු ය. | ඉතා ඉහළයි |
| ix. **පාංශු ඛාදන වැළැක්වීමේ ව්‍යුහයන්**<br><br>වැසි කාලයේදී අස්ථායී බෑවුම් මතුපිට හරහා වහී ජලය ගලා යාමේ ගලායාම අපේක්ෂා කළ හැකිය. එබැවින්,ඒ හරහා ඇළ මාර්ගයේ සිදුවන ජල දූෂණය වැළැක්වීම සඳහා මෙම ගලාඑන ජලය කාණු පද්ධතියක් හරහා පිටතට ගෙන යා යුතුයි. එබැවින් බෑවුම්වල සිදුවන ඛාදනය අවම කිරීමට පිරිසැලසුම හරහා ප්‍රවාහ වේගය අවම කිරීමේ ක්‍රම පිළිබඳ සලකා බැලිය යුතුය. | ඉහළයි |
| x. **අවම පශ්චාත් නඩත්තු සහ මෙහෙයුම් පිරිසැලසුම්**<br><br>අවමකරණ ක්‍රියාමාර්ග වලදී ජල කළමනාකරණය සඳහා ගුරුත්වාකර්ෂණ කාණු පද්ධතින් වැනි ක්‍රම පිළිබඳ සලකා බැලිය යුතුය. කාණු පද්ධති අවහිර වීම වැළැක්වීමට නළ විෂ්කම්භය, සිදුරු විෂ්කම්භය සහ තැබීමේ කෝණ ආදිය නිවැරදිව තැබිය යුතුය. ජල පරිවහන කාණු ඍජුව ස්වභාවික ජල මාර්ගයන්ට යොමු වන්නේ නම් රොන්මඩ තැන්පතු වැනි පාංශු ඛාදන වැළැක්වීම සඳහා අවම නඩත්තු පිරිවැයක් සහිත පිරිසැලසුම් සහ ව්‍යුහයන් හඳුන්වා දිය යුතු ය. මෙම ව්‍යුහයන් සඳහා භාවිතා කරන ද්‍රව්‍ය කල්පැවැත්ම සහ කාලගුණික තත්වයන්ට ඔරොත්තු දෙන පරිදි ප්‍රවේශමෙන් තෝරා ගත යුතුය. තවද පිරිසැලසුම්කරණයේදී ඛාදන වැළැක්වීමේ සහ අවම නඩත්තු පිරිවැයක් සහිත ක්‍රමවේද පිළිබඳ වැඩි අවධානය යොමු කළ යුතුය. | ඉහළයි |

## 9.7 ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ සිදුවන බලපෑම් අවම කිරීම

### 9.7.1 ඉදිකිරීම් අදියර තුළ පාරිසරික හා සමාජයීය කළමනාකරණය සඳහා කොන්ත්‍රාත්කරුගේ අනුකූලතාව

පාරිසරික හා සමාජීය බලපෑම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා ගනු ලබන පියවර සාමාන්‍යයෙන් සියලු නායයෑම් අවදානම් අවමකිරීමේ ස්ථාන වලට පොදු වේ. එසේම එවැනි බලපෑම් බොහෝ දුරට ඉදිකිරීම් සඳහා බලපෑම් එල්ල කරන බැවින් බලපෑම් අවම කිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතු වේ. මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉදිකිරීම් අදියරයේදී පාරිසරික හා සමාජයීය සෞඛ්‍ය හා ආරක්ෂාව (E & HS) කළමනාකරණයට අනුකූල වීම සඳහා "කොන්ත්‍රාත්කරුවන්ගේ අවශ්‍යතාවය" පිළිබඳ පුළුල් ලේඛනයක් සකස් කර ඇත. එම ලේඛනයෙහි මෙම ස්ථානයට අදාළ ප්‍රධාන කොටස් සහ එහි අදාලත්වය පිළිබඳ පහත වගුවේ දැක්වේ (වගුව 3). එය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ ලංසු ලේඛනයේ ඉදිරිපත් කළ යුතුය.

| ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුට අනුව ESMP යොමු අංකය | සංරචකය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|---|
| **2002. පාරිසරික හා සමාජයීය අධීක්ෂණය** | | |
| 2002.2 1) | වැඩබිම තුළ ගබඩා කිරීම් | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 2) | ශබ්දය හා කම්පන | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 3) | ඉරිතැලීම් සහ ගොඩනැගිලිවලට සිදුවන හානි | අදාළ වේ ( ගොඩනැගිලි) |
| 2002.2 4) | අපද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 5) | අබලි ද්‍රව්‍ය බැහැර කිරීම | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 6) | දුහුවිලි පාලනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 7) | ඉදිකිරීම් ද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 8) | ජලය | අදාළ වේ |
| 2002.2 9) | ශාක හා සත්ත්ව විශේෂ | සුලු වශයෙන් අදාළ වේ |
| 2002.2 10) | භෞතික හා සංස්කෘතික සම්පත් | සුලු වශයෙන් අදාළ වේ |
| 2002.2 11) | පාංශු ඛාදනය | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 12) | පාංශු දූෂණය | අදාළ වේ |
| 2002.2 13) | පස් හා වැලි ලබා ගැනීම | අදාළ වේ |
| 2002.2 14) | පාෂාණ ලබා ගැනීමේ ක්‍රියාවලි | අදාළ වේ |
| 2002.2 15) | නඩත්තු වාහන සහ යන්ත්‍ර | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 16) | මහජනතාවට සිදුවන අවහිරතා | බෙහෙවින් අදාළ වේ |
| 2002.2 17) | පොදු පහසුකම් සහ යටිතල පහසුකම් | අදාළ වේ |
| 2002.2 18) | පරිසර අලංකරණය | අදාළ වේ |
| **2002-5. පාරිසරික අධීක්ෂණය** | මූලික සමීක්ෂණය (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | ඉදිකිරීම් සිදුකරන අතරතුර සමීක්ෂණ (වායු, ජලය, ශබ්දය, කම්පන, ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ) | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | මෙහෙයුම් කාලසීමාව තුළ සමීක්ෂණ | ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම පරිශීලනය කරන්න |
| | වාර්තා පවත්වාගෙන යාම | අදාළ වේ |
| **2003. සේවා කොන්දේසි සහ ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව** | | |
| 2003.2 | ආරක්ෂාව පිළිබඳ සංවිධානකරණය සහ සන්නිවේදනය | බෙහෙවින් අදාළ වේ |
| 2003.4 | ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය | බෙහෙවින් අදාළ වේ |
| 2003.5 | ආරක්ෂාව පිළිබඳ වාර්තා සහ | බෙහෙවින් අදාළ වේ |

| | | |
|---|---|---|
| | අනතුරු දැනුම් දීම | |
| 2003.6 | ආරක්ෂිත උපකරණ සහ ඇඳුම් | බෙහෙවින් අදාළ වේ |
| 2003.7 | ආරක්ෂාව පිළිබඳ නිරීක්ෂණය | බෙහෙවින් අදාළ වේ |
| 2003.8 | ප්‍රථමාධාර පහසුකම්. | බෙහෙවින් අදාළ වේ |
| 2003.9 | සෞඛ්‍ය සහ ආරක්ෂිත තොරතුරු සහ පුහුණුව | බෙහෙවින් අදාළ වේ |
| | පැල උපකරණ සහ සුදුසුකම් ලත් පිරිස් | බෙහෙවින් අදාළ වේ |

**අදාළ වේ:** සෑම ව්‍යාපෘති වැඩබිමකටම අදාළව භාවිත කළ යුතු පොදු ESMP ලෙස මෙම කොටසින් දැක්වේ.

**බෙහෙවින් අදාළ වේ:** ආපදා අවදානම අවමකරණ ස්ථානයට අදාළව සකස් කරන ලද ESMP ට අනුකූල වන පරිදි පාරිසරික ප්‍රමිතීන් සකස් කිරීමට කොන්ත්‍රාත්කරු විසින් දැඩි අවධානයක් යොමු කළ යුතුය.

**අදාළ විය හැකි:** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාව ESMP හි පූර්ණ අවශ්‍යතා සඳහා මෙය අදාළ විය හැකිය.

**අදාළ නොවේ:** ස්ථානයේ ස්වභාවය මත මෙම කොටස් අදාළ නොවිය හැකිය.

**වෛකල්පිත:** අවශ්‍යතාවකදී භාවිත කළ හැකිය.

**ස්ථානීය විශේෂිත අධීක්ෂණ සැලැස්ම:** මෙම සැලැස්ම තුළ පවත්නා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

**පරිශීලනය කරන්න:** ක්‍රියාත්මක කිරීමට කොන්ත්‍රාත්කරුගේ වගකීම

### 9.7.2 ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණය

ඉදිකිරීම් කාලයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ස්ථානීය විශේෂිත අවදානම් අවමකරණ පියවර පහත දැක්වේ.

*වගුව 4 - ස්ථානීය විශේෂිත ES & HS අවමකරණ පියවරයන්*

| අවදානම් අවමකිරීමේ සංරචක | ව්‍යාපෘති අදියර | වගකීම |
|---|---|---|
| i. **ඉදිකිරීම් ක්‍රියාවලිය අතරතුර සිදුවන ඛාදනය වීමේ බලපෑම් අවම කිරීම**<br><br>වර්ෂා කාල සීමාවන්හිදී වැඩබිම එළි පෙහෙළි කිරීම, බෑවුම නැවත සකස් කිරීම සහ සුන්බුන් ඉවත් කිරීම වැනි කාර්යන්වල නොයෙදීම දැඩිව නිර්දේශ කෙරේ. එබැවින් ඉහළ බෑවුමේ අවදානම් අවමකරණ කටයුතු වියලි කාල සීමාවන්හිදී පමණක් සිදු කිරීමට සහ වර්ෂා කාල සීමාවන්හිදී අස්ථායී බෑවුමේ එවැනි කටයුතු සිදු නොකිරීමට දැඩිව නිර්දේශ කෙරේ. මේ පිළිබඳව ව්‍යාපෘතිය සැලසුම් අදියරයේදී අවධානය යොමු කළ යුතුය. තවද බෑවුම සකස් කිරීමේදී ඇති වූ සුන්බුන් හේතුවෙන් කාණු පද්ධති පිරී යාම වැළැක්වීමට රොන්මඩ තැන්පතු හඳුන්වා දිය යුතු ය. | භූමිය සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| ii. **ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම**<br><br>කොන්ත්‍රාත්කරු විසින් නේවාසික ප්‍රදේශයක් තුළ අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු බැවින්, ඉදිකිරීම් කටයුතු සඳහා කළමනාකරණ සැලැස්මක් සකස් කළ යුතුය.එම සැලැස්ම තුළ වැඩබිමෙහි ඉඩ පහසුකම් උපරිමයෙන් උපයෝජනය වන හා ආරක්ෂාව උපරිම වන පරිදි ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා කිරීම, රථ වාහන නැවැත්වීම, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම සහ පිරිසිදු කිරීම වැනි දෑ සඳහා තෝරා ගැනීම් කළ යුතුය. | භූමිය සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| iii. **ඇතුළු නොවන කලාපය**<br>ඉදිකිරීම් අදියරේදී මෙම ස්ථානයේ බෑවුම් අස්ථාවර වීමේ අවදානම පිළිබඳව PMU විසින් සවිස්තරාත්මක තක්සේරුවක් සිදු කරමින් 'ඇතුළු නොවන කලාපයක්" ප්‍රකාශ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.<br>එසේම වාහන ධාවනයේදි සිදුවන අනතුරු, යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමේදී සිදුවන අනතුරු හා විදුලි කාන්දුවීම් ආදිය අවම කිරීම සඳහා සෞඛ්‍ය හා ආරක්ෂණ කළමනාකරණ සැලැස්ම තුල ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය. තවද බෑවුමේ අස්ථායීතා අවදානම දැක්වෙන සංඥා පුවරු මෙම ප්‍රදේශයේ ප්‍රදර්ශනය කිරීමට දැඩි ලෙස නිර්දේශ කෙරේ. | ඉදිකිරීම් අදියර | • PMU හි E & S ඒකකය<br>• කොන්ත්‍රාත්කරු |
| iv. **යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍ය ප්‍රවාහනය**<br><br>ඉදිකිරීම් අදියරෙදී යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය සහ වාහන ප්‍රවාහනය සඳහා කොන්ක්‍රීට් අතුරා ඇති ප්‍රවේශ මාර්ග භාවිතා කරයි. එබැවින් සිදුවිය හැකි අනතුරු සහ මාර්ගයට සිදුවන හානි ඉහල බැවින් දැඩි අවධානයෙන් සිටිය යුතුය. | ඉදිකිරීම් අදියර | • PMU හි E & S ඒකකය<br>• කොන්ත්‍රාත් කරු |

| | | |
|---|---|---|
| v. **ශබ්දය හා කම්පන පාලනය**<br><br>වැඩබිම තුළ යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීමේදී ශබ්දය හා කම්පන ඇතිවිය හැකි අතර මෙම යන්ත්‍රෝපකරණ තුළින් ඇතිවන ශබ්දය හා කම්පන අවට පරිසරයට සහ ආසන්න පිහිටි නිවාසවල පදිංචිකරුවන්ට අහිතකර බලපෑම් ඇතිකළ හැකිය. එබැවින්, කම්පන ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සම්මත කම්පන මට්ටම් තුළ සිදු කළ යුතු අතර කම්පන හේතුවෙන් නිවාස/ගොඩනැගිලි ව්‍යුහයන්ට හානි සිදු නොවිය යුතුය. නිවෙස්වල පවතින ඉරිතැලීම් පිළිබඳව පූර්ව සමීක්ෂණක් සිදු කළ යුතු අතර ඉදිකිරීම් අතරතුර සහ පසුව නැවත සමීක්ෂණ සිදු කළ යුතුය. ඉදිකිරීම් කටයුතු හේතුවෙන් යම් ගොඩනැගිල්ලකට හානි සිදුවුවහොත් ඊට සුදුසු වන්දි මුදලක් ලබා දිය යුතුය. | ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| vi. **ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීම**<br><br>ඉදිකිරීම් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී කොන්ත්‍රාත්කරු විශේෂ අවධානයක් යොමු කළ යුතුය. එබැවින් අපද්‍රව්‍ය ජනනය වන්නේ නම් ඒවා වැඩබිම තුළ බැහැර නොකළ යුතු අතර වැඩබිම තුළ විධිමත්ව ගබඩා කර PMU විසින් අනුමත කරනු ලබන ක්‍රමවේදයක් හරහා ඒවා බැහැර කළ යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| vii. **දුහුවිලි සහ වායු දූෂණය පාලනය කිරීම**<br><br>අවට ප්‍රදේශවාසීන්ට අවදානමක් නොවන ලෙස දූවිලි උත්පාදනය අවම කිරීමට කොන්ත්‍රාත්කරු කටයුතු කළ යුතුය. තවද ආරක්ෂිතව සේවා ස්ථාන පවත්වා ගැනීමට සහ අවට නිවාසවලට සිදුවන බාධා අවම කිරීමට දූවිලි සාන්ද්‍රණය පාලනය කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.<br>උදා- අධික දූවිලි ජනනයවේ යැයි අපේක්ෂා කරන්නේ නම් විශේෂ තිර ආදිය භාවිතා කළ යුතුය. | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| viii. **ඉදිකිරීම් සඳහා ජලය**<br><br>ඉදිකිරීම් කටයුතු සඳහා අනුමත ස්ථානවලින් ජලය ලබා ගත යුතුය. කොන්ත්‍රාත්කරු අවට නිවාසවලින් හෝ ප්‍රධාන විදුලි රැහැනෙන් ජලය සහ විදුලිය භාවිතා කිරීමට අදහස් කරන්නේ නම්, ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කර අවශ්‍ය අවසරය ලබා ගත යුතුය. | ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| ix. **සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු**<br><br>මෙම ස්ථනයේ සේවකයින්ට ඉහළ අවදානම් තත්වයන් යටතේ කටයුතු කිරීමට සිදු වන බැවින්, ESMP හි කොන්ත්‍රාත්කරුවන්ගේ වගකීම් දක්වන 2003 දරණ සේවා "කොන්දේසි, ප්‍රජා සෞඛ්‍ය සහ ආරක්ෂාව" වගන්තිය යටතේ දක්වා ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, මෙම නිර්දේශයන් සංවිධානාත්මක ආරක්ෂක අධීක්ෂණ පද්ධතියක් තුළ අනුගමනය කළ යුතුයි.<br><br>• මීට අමතරව, අස්ථායී බෑවුම්වල ඉදිකිරීම් කටයුතු වල නිරත වීම වැසි සමයේදී ඉතා අවදානම් සහිත බැවින් වැසි කාලවලදී ප්‍රමාණවත් කාලයක් සඳහා ඉදිකිරීම් කටයුතු නතර කළ යුතුය.<br>• සේවකයාගේ සහ මහජනයාගේ ආරක්ෂාව සඳහා මෙම | ඉදිකිරීම් අදියර | • PMU හි E & S ඒකකය<br>• කොන්ත්‍රාත්කරු |

| | | |
|---|---|---|
| ස්ථානය සඳහා හොඳ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සහ පූර්ණ කාලීන මුරකරුවන් නිර්දේශ කෙරේ.<br>• පාෂාණ කඩා වැටීමේ අවදානමෙන් කම්කරුවන් සහ ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහා අවදානම් ස්ථානවල ආරක්ෂිත බාධක සහ ආරක්ෂිත දැල් සවි කළ යුතුය.<br>• වෙනත් අනතුරු සඳහා නිසි හදිසි කළමනාකරණ ඒකකයක් (ප්‍රථමාධාර පහසුකම්, ආරක්ෂිත ද්‍රව්‍ය, රෝහල්ගත කිරීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම්) මෙම අඩවිය සඳහා පවත්වාගෙන යා යුතුය. | | |
| x. **ආරක්ෂිත ව්‍යුහයන් / සංඥා පුවරු**<br><br>ඉදිකිරීම් අදියරේදී ඉහළ බෑවුම් ප්‍රදේශවලින් කම්කරුවන් බිම පතිත වීමේ අවදානම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂිත වැටවල් ස්ථාපිත කළ යුතුය. අස්ථායී බෑවුම් ප්‍රදේශයේ බෑවුමේ අස්ථායීතා අවදානම දැක්වෙන අනතුරු ඇඟවීමේ පුවරු තැබිය යුතුය. ඉදිකිරීම් කටයුතු සිදු නොවන වර්ෂා කාලවලදී අවදානම වැඩි බැවින් ව්‍යාපෘති නොමැති කාලසීමාව තුළද ආරක්ෂිත සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ. | ඉදිකිරීම් අදියර | • PMU හි E & S ඒකකය<br>• කොන්ත්‍රාත්කරු |
| xi. **කොන්ත්‍රාත්කරු යටතේ සිටින සේවකයින්ගේ සනීපාරක්ෂක පහසුකම් භාවිතය**<br><br>කොන්ත්‍රාත්කරු යටතේ සිටින සේවකයින් සඳහා වෙනම සනීපාරක්ෂක පහසුකම් සැපයිය යුතුයි. | ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| xii. **වැඩකරන කාලය**<br><br>ඉදිකිරීම් කටයුතු දිවා කාලයේ හෝ රාත්‍රියේ සිදු කිරීම වඩාත් සුදුසුය. | ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| xiii. **මිනිසුන් මෙම ප්‍රදේශයට ඇතුළු වීමේ හෝ හරහා ගමන් කිරීමේ අවශ්‍යතාව**<br><br>පූර්ණ කාලීන මුරකරුවන් යෙදවීම, අනතුරු ඇඟවීමේ සලකුණු පවත්වාගෙන යාම මඟින් මෙයට ඇතුලු විය හැකි අනවසර ප්‍රවේශය වැළැක්විය යුතුය. | ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| xiv. **ක්‍රමවත් ගෘහ පාලනය**<br><br>ඉදිකිරීම් අතරතුර හොඳ ගෘහ පාලනයක් පවත්වාගෙන යාම හරහා දෘශ්‍ය දූෂණය (VISUAL POLLUTION) අවම කළ යුතුය | වැඩබිම සකස් කිරීම සහ ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |
| xv. **සේවක චර්යා ධර්ම පද්ධතිය**<br>කොන්ත්‍රාත්කරු විසින් යෝග්‍ය සේවක චර්යා ධර්ම පද්ධතියක් ඇති කිරීම මඟින් වැඩබිම් සේවකයින් සහ ආසන්න ප්‍රජාව අතර ගැටුම් ඇතිවීම වැළැක්විය යුතුය. | ඉදිකිරීම් අදියර | • කොන්ත්‍රාත්කරු |

### 9.7.3 වැඩබිම සඳහා වන අධීක්ෂණ අවශ්‍යතා

පහත දැක්වෙන අධීක්ෂණ සැලැස්ම ඉදිකිරීම් අදියරයේදී මෙම වැඩබිමට විශේෂිත වූ අධීක්ෂණ සැලැස්මකි. මීට අමතරව, කොන්ත්‍රාත්කරුවන්ගේ ESMP සඳහා ඇති අනනුකූලතාව දක්වා ඇති අධීක්ෂණ ක්‍රියා පටිපාටිය ඒ ආකාරයෙන්ම ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ESMP ක්‍රියාපටිපාටිය ලංසු ලේඛනයේ සඳහන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ESMP සඳහා වන පිරිවැය වෙනම ගෙවුම් අයිතමයක් ලෙස දැක්වීමට අවශ්‍ය වේ. තෝරාගත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික හා සමාජ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු අතර PMU විසින් එය අනුමත කිරීම අවශ්‍ය වේ.

*වගුව 5 - ඉදිකිරීම් අදියර සඳහා පාරිසරික හා සමාජයීය අධීක්ෂණ යාන්ත්‍රණය*

| **අධීක්ෂණ අවශ්‍යතාව** | **පරාමිතීන්** | **අධීක්ෂණය කළ යුතු වාර ගණන** |
|---|---|---|
| i. මූලික අධීක්ෂණය | ජලයේ ගුණාත්මකභාවය | - |
| | ආසන්න නිවාසවල ඉරිතැලීම් පිළිබඳ පූර්ව සමීක්ෂණය | එක්වරක් * |
| | භූමිය මත සිදුවන කම්පන | එක්වරක් * |
| | වාතාශ්‍රයේ ගුණාත්මක භාවය: විශේෂිත සාධක | එක්වරක් * |
| | වැඩබිම් ශබ්ද මිනුම් කිරීම | එක්වරක් * |
| ii. ඉදිකිරීම් අතරතුර | ජලයේ ගුණාත්මකභාවය | - |
| | ආසන්න නිවාසවල ඉරිතැලීම් පිළිබඳ පූර්ව සමීක්ෂණය | එක්වරක් * |
| | භූමිය මත සිදුවන කම්පන | භූ විදුම්, භූ කැණීම් හෝ කම්පන ජනනය වන අනෙකුත් කටයුතු සිදු කරන විට |
| | ඉදිකිරීම් ශබ්දය | අධික ශබ්දය නිකුත් වන අවස්ථාවලදී මාසයකට වරක් |
| | විශේෂිත අවස්ථාවලදී වාතාශ්‍රයේ ගුණාත්මක භාවය: | මාසයකට වරක් |
| iii. රථවාහනවලින් සිදු කරන විමෝචන | ක්‍රියාත්මක වන සියලුම යන්ත්‍රෝපකරණ/වාහන සඳහා අදාළ වන පරිදි විමෝචන පාලන පරීක්ෂණ සහතිකය තිබිය යුතුය-ES නිලධාරියා විසින් එය පරීක්ෂා කළ යුතුය. | |
| iv. අධීක්ෂණ නියෝජිතායතන | ★ ඉරිතැලීම් සමීක්ෂණ හැර අනෙකුත් සියලුම පරාමිතීන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචිය සහිත දක්ෂ ස්වාධීන අධීක්ෂණ ආයතනයක්<br>★★ ඉරිතැලීම් පිළිබඳ සමීක්ෂණ සිදු කිරීම සඳහා PMU හි ලියාපදිංචි නියෝජිතායතනයක් විසින් සිදු කළ යුතුයි | |
| v. වාර්තා කිරීමේ අවශ්‍යතා | **ඇළ මාර්ගවල ජලයේ ගුණාත්මක භාවය** - CEA විසින් 2017 වර්ෂයේ පළ කරන ලද ස්වභාවික ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ සම්මතයන් සමග සන්සන්දනය කිරීම<br>**ගොඩනැගිලිවල ඉරිතැලීම් පිළිබඳ මූලික සමීක්ෂණය** - වෘත්තීමය වාර්තා<br>**භූමියේ කම්පන තත්ත්ව** - යන්ත්‍ර සූත්‍ර භාවිතය, ඉදිකිරීම් කටයුතු සහ රථවාහන ධාවනය මගින් භූමිය මත ඇතිවන කම්පන පිළිබඳ CEA විසින් ඉදිරිපත් කර ඇති අතුරු සම්මතයන්<br>**පසුබිම් ශබ්ද මිනුම් කිරීම** - 1996 මැයි 23 දිනැති අංක 924.1 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය - CEA<br>**වායු ගුණාත්මකභාවය පිළිබඳ කරුණු** - ජාතික වායු ගුණාත්මකභාවය පිළිබඳ සම්මතයන් දැක්වෙන 2008 අගෝස්තු 15 දිනැති අංක 1562/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය- ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරිය | |

## 10. මහජනතාව සහ ව්‍යාපෘති පාර්ශවකරුවන් දැනුවත් කිරීම - පවත්වන ලද හෝ පැවැත්වීමට නියමිත මහජන දැනුවත් කිරීම්

### 10.1. මහජනතාව දැනුවත් කිරීම

ක්ෂේත්‍ර චාරිකාවේදී අවම කිරීමේ ස්ථානයට සමීපව ජීවත් වන පදිංචිකරුවන්ගෙන් අදහස් විමසන ලද අතර එම සියලුම නිවාස ඔවුන්ගේ පුද්ගලික අයිතිය යටතේ පවතී. නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සහ අරමුදල් සැපයීමේ යාන්ත්‍රණය පිළිබඳව තමන් දැනුවත්ව සිටි බව අවමංගල්‍ය භූමිය අවට ජීවත්වන නිවැසියන් ප්‍රකාශ කරන ලද අතර ඊ.එම්.කේ.ජී.ලොකුබණ්ඩාර මහතා, එච්.ජී.රත්නප්පු මහතා සහ අයි.ජී. ධර්මරත්න මහතා යන අය ව්‍යාපෘතියට තම කැමැත්ත පළ කළ අතර ව්‍යාපෘතියට පූර්ණ සහයෝගය ලබා දීමට ද කැමැත්ත පළ කරන ලදී.

ලොකුබණ්ඩාර මහත්මියගේ ප්‍රකාශයට අනුව, ඔවුන්ගේ ජීවනෝපාය මෙම ස්ථානය මත පදනම් වී ඇති බැවින්, අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හරහා එම ස්ථානයේම රැඳී සිටීමට සිය කැමැත්ත පළකරන ලදී. එමෙන්ම නාය ගිය ප්‍රදේශයේ සාදික්කා පැල 50ක් පමණ දැනටත් පවතින අතර අවම කිරීමේ කටයුතු හේතුවෙන් සමහර පැල ඉවත් කිරීමට නියමිත වුවහොත් ඉඩමේ හිමිකරුගේ විරෝධයක් නොමැති බව ප්‍රකාශ කරන ලදී.

### 10.2. පාර්ශවක/ ආයතනික උපදේශනය

ඉඩම්වල පුද්ගලික අයිතිය ඇති බැවින්, නිශ්චිත පාර්ශවකරුවන්/ ආයතනික උපදේශන අවශ්‍ය නොවේ.

## 11. ශ්‍රී ලංකා ජාතික සෞඛ්‍ය අධිකාරිය විසින් නිකුත් කරන ලද කොවිඩ් - 19 වෛරසය වැළැක්වීමේ පියවර

කොවිඩ් 19 වෛරස් ආසාදනය ලොව මුළුමනින්ම තුරන් කර නොමැත. එබැවින් මෙම වෛරසය ව්‍යාප්ත වීම වැළැක්වීමට/ පාලනය කිරීමට සහ යම් වෛරස් ආසාදන තත්වයක් හඳුනා ගැනීමේදී කලබලයට පත්වීම වැළැක්වීමට සියළුම කොන්ත්‍රාත්කරුවන් විසින් කොවිඩ් - 19 පූර්ව සූදානම් වීමේ සැලැස්මක් සකස් කළ යුතු අතර 2021 ජනවාරි මස CIDA ආයතනය විසින් නිකුත් කරන ලද " කොවිඩ්-19 හා ඩෙංගු සඳහා වන සෞඛ්‍යය හා ප්‍රතිශක්තීකරණ වැඩිදියුණු කිරීමේ මාර්ගෝපදේශය, ඉදිකිරීම් කර්මාන්තය සඳහා වන CIDA සෞඛ්‍යය මාර්ගෝපදේශය (4වන සංශෝධනය)"

## 12. කම්කරු කළමනාකරණය

නිසි සේවක කළමනාකරණ සබඳතා පවත්වා ගනිමින් ව්‍යාපෘතියේ සේවකයින්ට සාධාරණ ලෙස සැලකීමට මෙන්ම ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පහසුකම් සැපයීමේ වගකීම PMU සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සතුය.

එහි ප්‍රධානතම අරමුණු වන්නේ;

- රැකියාවේ ආරක්ෂාව සහ සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යාපෘති සේවකයින්ගේ සාධාරණ සැලකීම, වෙනස් කොට නොසැලකීම සහ සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයින්, ළමුන් සහ සංක්‍රමණික සේවකයින්, කොන්ත්‍රාත් සේවකයින්, ප්‍රජා සේවකයින් සහ ප්‍රාථමික සැපයුම් සේවකයින් වැනි අවදානමට ලක්විය හැකි සේවකයින් ඇතුළු සියලුම ව්‍යාපෘති සේවකයින් සුදුසු පරිදි ආරක්ෂා කිරීම.
- සියලුම ආකාරයේ බලහත්කාර ශ්‍රමය සහ ළමා ශ්‍රමය භාවිතය වැළැක්වීම.
- ජාතික නීතිවලට අනුකූල වන පරිදි ව්‍යාපෘති සේවකයින්ගේ සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීමේ මූලධර්මවලට සහාය වීම.
- ව්‍යාපෘති සේවකයින්ට රැකියා ස්ථානයේ ගැටළු මතු කිරීමට ප්‍රවේශ විය හැකි අවස්ථා ලබා දීම.

## 13. නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව, එකඟතාව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආයතනයන්හි අනුමැතිය ලබා ගැනීම

*වගුව 6 - නිෂ්කාශන, විරුද්ධත්වයක් නොමැති බව එකඟතාව සහ අනුමැතිය*

| අවශ්‍යතාව/ අනුමත කිරීම/ ආයතනය | ව්‍යාපෘතියට අදාළත්වය |
|---|---|
| **13.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** | |
| දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය | ව්‍යාපෘති යෝජනාව ප්‍රධාන අමාත්‍යවරයා සහ දිස්ත්‍රික්කයේ අනෙකුත් පාර්ශවකරුවන් සහභාගී වන දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය. මෙම කමිටුවේදී PMU හි නිලධාරියෙකු විසින් ව්‍යාපෘතිය පිළිබඳව සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය පිළිබඳවත් එහිදී ඇතිවන පාරිසරක හා සමාජයීය ගැටලු ඇතුළු කරුණු පිළිබඳවත් සාකච්ඡා කරනු ලැබේ. මෙහිදී වැඩි අවධානයක් යොමු වන ගැටළු පිළිබඳව ESMP හිදී පැහැදිලි කරනු ලැබේ. මෙම කමිටුවේදී ගනු ලබන තීරණ සහ නිර්දේශ පිළිබඳව ESMP හිදී සලකා බලනු ලැබේ. |
| සැලසුම් කමිටුවේ අනුමැතිය | යටවත්ත ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම |
| **13.2 ව්‍යාපෘතියට අදාළ රජයේ/ඉඩම් හිමියන්ගේ අනුමැතිය** | |
| මධ්‍යම පරිසර අධිකාරිය | 1951 අංක 25 දරණ පාංශු සංරක්‍ෂණ පනත මගින් මාතලේ දිස්ත්‍රික්කය සංවේදී කලාපයක් ලෙස නම් කර ඇති බැවින් දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාව ලබා ගත යුතු ය. |
| වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව/ වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව | වන රක්ෂිත සහ වනජීවී වාසස්ථාන නොමැති බැවින්; වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වනජීවී දෙපාර්තමේන්තුවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |
| භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | පාෂාණ, ඛනිජ වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගැනීමට, ප්‍රවාහනයට සහ ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීම (අවශ්‍ය නම් පමණක්) |
| යටවත්ත ප්‍රාදේශීය සභාව | අපද්‍රව්‍ය සහ කොළරොඩු බැහැර කිරීම සඳහා යටවත්ත ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගැනීම |
| ලංකා විදුලිබල මණ්ඩලය | විදුලි බල සැපයුම ලබා ගැනීමට ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් අනුමැතිය ලබා ගැනීම |
| **13.3 ඉඩම් හිමිකාරීත්වයෙන් කැමැත්ත / විරුද්ධත්වයක් නොමැති බව / නීත්‍යානුකූල ගිවිසුම** | |
| ඉඩම් හිමිකර- පුද්ගලික අයිතිය (පහළ බෑවුම) | ව්‍යුහයන් ඉවත් කිරීමට, ඉඩමට ප්‍රවේශ වීමට, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ දිගුකාලීන නඩත්තු කටයුතුවල නිරත වීමට කිසිදු විරෝධයක් නොදක්වන බවට ඉඩම් හිමියා සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය අතර නීත්‍යානුකූලව ගිවිසුමක් අත්සන් කෙරේ. |

*වගුව 7- අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජිත (තාවකාලික) කාල රාමුව*

| **අනුමැතිය ලබා ගැනීම** | මාසය 01 | | | | මාසය 02 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 | සතිය 01 | සතිය 02 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**<br>***දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***සැලසුම් කමිටුවේ අනුමැතිය***<br>ව්‍යාපෘති විස්තර භාරදීම<br>ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කිරීම<br>ගැටලු නිරාකරණය කර ගැනීම<br>අනුමැතිය | | | | | | | | |
| ***අනෙකුත් අනුමැතීන් ලබා ගැනීම***<br>CEA<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>GSMB | | | | | | | | |
| ***ඉඩම් හිමිකරුවන්ගේ එකගතාවය/විරුද්ධත්වයක් නොමැති බව*** | | | | | | | | |

## 14. මෙම ව්‍යාපෘතිය සම්බන්ධ අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය

*මෙම ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවිය හැකි ගැටළු සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩල පිහිටුවීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාරිසරික හා සමාජයීය නිලධාරී විසින් සිදු කල යුතුය. (අභියාචනා මණ්ඩල පිහිටුවීමට අදාල නිර්දේශ පාරිසරික හා සමාජයීය කළමනාකරණ රාමුව (ඊඑෆ්) යටතේ සපයා ඇත.)*

*සමාජීය සහ පාරිසරික ගැටළු සම්බන්ධ සියලුම පැමිණිලි වාචිකව/දුරකථනයෙන් හෝ ලිඛිතව පහත පුද්ගලයා/ස්ථානය වෙත එවීමට හැකිය.*

- *ව්‍යාපෘති අධ්‍යක්ෂ/ RLVMMP*
    - *දුරකතනය : +94 112 559 869*
    - *ෆැක්ස් : +94 112 502 611*
    - *විද්‍යුත් තැපෑල : pd.rlvmmp@gmail.com*
    - *වෙබ් අඩවිය : rlvmmp.lk*
- *දිස්ත්‍රික් නිළධාරී/ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) හෝ*
- *වැඩබිම් නිළධාරී/ RLVMMP*
- *මාර්ගගත අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය (***https://rlvmmo.lkgrms***)*

## 15. ව්‍යාපෘති තොරතුරු නිකුත් කිරීම

පහත දැක්වෙන ආයතන සහ සංවිධාන වෙත අවම වශයෙන් පහත වගුවෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘතියේ ES තොරතුරු තොරතුරු නිකුත් කිරීම PMU හි වගකීම වේ.

*වගුව 8 - යෝජිත තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය*

| තොරතුරු | යෝජිත නියෝජිතායතන | තොරතුරු බෙදා හැරීමේ යාන්ත්‍රණය |
|---|---|---|
| i. ව්‍යාපෘති සැලැස්ම (ස්ථානීය විස්තර, පිරසැලසුම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද) | දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, අනෙකුත් දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතායතන, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, අනුමැතිය සහ එකඟතාව ලබා ගැනීම |
| ii. පාරිසරික හා සමාජයීය කළමනාකරණ සැලැස්ම | දිස්ත්‍රික් CEA, AIIB, මාර්ග සංවර්ධන අධිකාරිය | රැස්වීම්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම, අනුමැතිය සහ එකඟතාව ලබා ගැනීම |
| iii. අධීක්ෂණ වාර්තා (මූලික හා ඉදිකිරීම් අතරතුර) | දිස්ත්‍රික් CEA, AIIB සහ අවශ්‍යතාව පරිදි අදාළ පාර්ශව | ප්‍රගති වාර්තා, විශේෂ රැස්වීම්, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම |
| iv. පාරිසරික අනුකූලතාව සහ ශ්‍රමිකයින්ගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සඳහා ස්ථානීය පරීක්ෂාව | දිස්ත්‍රික් CEA, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB සහ අදාළ වෙනත් පාර්ශව | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාළ වාර්තා ලබා දීම |
| v. පාරිසරික සහ සෞඛ්‍ය කරුණු සම්බන්ධව ගනු ලැබූ තීරණ සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රාදේශීය ලේකම්, විහාරස්ථානයේ නායක හිමි, ග්‍රාම නිලධාරී, මාර්ග සංවර්ධන අධිකාරිය NBRO දිස්ත්‍රික් කාර්යාලය, AIIB සහ අදාළ වෙනත් පාර්ශව | රැස්වීම්, ගිවිසුම් සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම |
| vi. අභියාචනා සලකා බැලීමේ යාන්ත්‍රණය | අදාළ පාර්ශව, AIIB | ලිඛිත හා වාචික සන්නිවේදන, අදාළ වාර්තා ලබා දීම |

## ඇමුණුම 1: හඳුනාගත් ස්ථානයේ ස්වභාවය සහ උපදේශනය දැක්වෙන ඡායාරූප



*අර්ධ හානි වූ වින්දිතයාගේ නිවසේ වර්තමාන තත්ත්වය*

(a)



(b)



*අවම කිරීමේ ප්‍රදේශයේ පහළ බෑවුමේ පිහිටා ඇති අධි අවදානම් නිවාස*
*(a) (අ) ලොකුබණ්ඩාර මහතාගේ නිවස (ආ) එච්.ජී.රත්නප්පු මහතාගේ නිවස*







ජල මට්ටම මැනීම සඳහා අවම කිරීමේ ස්ථානයේ ඉහළ බෑවුමේ තබා ඇති Piezometer

පරිශ්‍රයේ ඉහළ බෑවුමේ පිහිටා ඇති පාෂාණ





නායයාමේ ආරම්භක ප්‍රදේශයේ පිහිටා ඇති ඉරි තැලීම් සහ ගිලා බැසීම්





 

*මහජන උපදේශනය*